සැ. යු. - 2023.01.27 දින පළකරන ලද අංක 2317 ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,318 - 2023 පෙබරවාරි මස 03 වැනි සිකුරාදා - 2023.02.03**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... | 38 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 41 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2023 පෙබරවාරි මස 24 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 පෙබරවාරි මස 10 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**206 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය.''**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

## මීගමුව දිසා අධිකරණයේ දී ය

### පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී,
(කලින් මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට්ස් පීඑල්සී වශයෙන් හැඳින්වූ)
අංක 236, ගාලු පාර, කොළඹ 03.

කොළඹ දිසා අධිකරණ
නඩු අංකය - DMB 109/15
ඇස්කිසි අංකය - 113/22

........................*පැමිණිලිකරු..*

*එදිරිව*

මෙතිස්ගේ ප්ලැසිඩස් ලයනල් දබරේරා,
අංක 245/34, කොන්දගම්මුල්ල,
දෙමන්හන්දිය.

...............................*විත්තිකරු..*

ඉහත නම් සඳහන් විත්තිකරු වෙතය.

වර්ෂ 2019 ක් වූ දෙසැම්බර් මස 17 වැනි දින ඇතුලත් කර ඇති තීන්දු ප්‍රකාශය ප්‍රකාරව ඉහත නම් කර ඇති විත්තිකරු විසින් පැමිණිලිකරුට,

(අ) රුපියල් හතලිස් අටලක්ෂ හතලිස් හතර දහස් අටසිය හතලිස් දෙකයි ශත අසූඅට (4,844,842.88) ක මුදලක් සහ එම මුදල සම්පූර්ණයෙන් ගෙවා අවසන් වන තෙක් 2015.03.27 වන දින සිට ප්‍රධාන ණය මුදල මත වසරකට 26% ක් බැගින් වූ පොළියක් ද, හිඟ තබන ලද වාරික මත 5% දඩ පොළිය සහ වෙනත් වියදම් ද ගෙවීමටත්, සහ

(ආ) නඩු ගාස්තු ලබා දෙන ලෙසට ත් විත්තිකරු එකඟ වී ඇති හෙයින් ද,

එසේ වුවත් පැමිණිලිකාර ආයතනය විසින් පොළී අයකර ගැනීමේ දී සිවිල් නීති ආඥා පනතේ 5 වන වගන්තියට යටත්වන බැවින් ගෙවීමට හිඟව ඇති මුදලට ගණනය කරන පොළිය එකී හිඟ මුදල ඉක්මවා නොයන මුදලක් විය යුතු බවට නියෝග කොට තීන්දු ප්‍රකාශ කර ඇති බැවින් ද,

ඒ අනුව විත්තිකරු විසින් තීන්දු ප්‍රකාශයෙන් පසුව කිසිදු මුදලක් ගෙවා නොමැති බවත්, මුදල් ගෙවීම අපොහොසත් වී සහ පැහැර හැර ඇති බවත්, ඒ අනුව විත්තිකරුට අයත් චංචල සහ නිශ්චල දේපල වත්කම් බැරකම් සහ ලැබීම් තහනම් කර අවශ්‍ය වුවහොත් ඒවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා මුදල් අයකර දීමට බලය පැවරී ඇති හෙයින් ද, මෙහි පහත උපලේඛනයේ විස්තර කරනු ලබන දේපල, **වර්ෂ 2023 ක් වූ අප්‍රේල් මස 06 වැනි දින ප.ව. 2.30 ට** එකී දේපල පිහිටා ඇති දෙමංහන්දිය, ආනන්දාරාම පාර, කලුවරිප්පුව යන ගම පිහිටි කැකුණගහමුකලාන දරන ඉඩමට අදාල 4693 දරන පිඹුරේ කැබලි අංක 26 දරන කොටස මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් ප්‍රසිද්ධ කොට ප්‍රකාශ කරනු ලැබේ.

*දේපලට පිවිසීම.-* මීගමුව සිට කටාන පාරේ කි. මී. 6 ක් පමණ යන විට දකුණට ඇති ආනන්දාරාම පාර හමුවේ. එහි මීටර් 50 ක් ඉදිරියට ගොස් වමට ඇති කොන්ක්‍රීට් පාරෙන් වමට හැරී මීටර් 500 ක් පමණ යනවිට වම්පස පන්සල හමුවේ. එහි තාප්පය අසලින් වමට ඇති පාරේ යන විට එහි කෙළවර වම්පස පිහිටි කලුවරිප්පුව ගම පිහිටි කැකුණගහමුකලාන දරන ඉඩමට අදාල අංක 4693 දරන පිඹුරේ කැබලි අංක 26 දරන පර්චස් 12.50 ක් විශාල ඉඩම හමුවේ.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසියේ දී ඉහළම ලංසු තබන්නා ගැණුම්කරු වන අතර, වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින්,

i. මුල් ගැණුම් මිලෙන් 25% ක මුදලක් ද,
ii. තක්සේරු ගාස්තුව වන 0.5% ක් ද,
iii. වෙන්දේසි ගාස්තු සහ රජයේ ගාස්තු ද,

විකිණීම අවසන් වූ වහාම ගැණුම්කරු විසින් අදාල මුදලින් මා වෙත (වෙන්දේසිකරු) ගෙවිය යුතුය. චෙක්පත් භාරගනු නොලැබේ. ගැණුම් මිලෙන් ගෙවන ලද්දේ 25% ක මුදලක් පමණක් නම් ගැණුම් මිලෙන් ඉතිරි මුදල වන 75% ක මුදල දින 30 ක් ඇතුලත කොළඹ දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවට තැන්පත් කළ යුතුය.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරලේ, දූනගහපත්තුවේ, මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයට අයත් කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ කටාන ප්‍රාදේශීය බල සීමාව තුළ 94 බටහිර කළුවරිප්පුව ග්‍රාම නිලධාරී කොට්ඨාසයට අයත් බටහිර කළුවරිප්පුව යන ගම පිහිටි කැකුනගහමූකලාන නමැති ඉඩමට 2001.09.24 දින ඩබ්. එස්. එස්. පෙරේරා බලයලත් මානක තැන මැන සාදන ලද අංක 4693 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් 26 දරන ඉඩම් කොටසට මායිම් උතුරට - ලොට් 30 (මීටර් 06 ක් පළල පාරකට වෙන් කළ බිම් තීරය)ද, නැගෙනහිරට - ලොට් 9 (මීටර් 06 ක් පළල පාරකට වෙන් කළ බිම් තීරය)ද, දකුණට ලොට් 23 ද සහ බස්නාහිරට ලොට් 27 ද යන මායිම් තුළ පිහිටි පර්චස් දොළහයි දශම පහයි බිංදුව (පර්. 12.50) ක් හෙවත් හෙක්ටයාර් 0.03162 විශාල ඉඩම් කොටස හා ඒ තුළ පිහිටි තුළ පිහිටි ගසකොළ, පළතුරු ගොඩනැගිලි ආදී සෑම සියලු දේත් සමඟ වේ. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ H74/124 දරන පත්ඉරුවේ ලියාපදිංචි වී ඇත.

මාර්ග අයිතිය ඉහත කී අංක. 4693 දරන පිඹුරේ නිරූපිත ලොට් 30 සහ ලොට් 90 දරන (මීටර් 06 ක් පළල පාරකට වෙන් කළ) බිම් තීරයත් පොදුවේ පරිහරණය කිරීමේ මාර්ග පරවශ්‍යතා අයිතිවාසිකම ද සමඟ වේ.

එම්. එම්. කේ. ශ්‍රියාන්ත,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය - මීගමුව.

වර්ෂ 2023 ක් වූ ජනවාරි මස 18 වැනි දින.

02-13/1

---

**මීගමුව දිසා අධිකරණයේ දී ය**

පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

කොළඹ දිසා අධිකරණ
නඩු අංකය - DMB 109/15,
මීගමුව දිසා අධිකරණ
ඇස්කිසි අංකය - 113/22

මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී,
(කලින් මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට්ස් පීඑල්සී වශයෙන් හැඳින්වූ)
අංක 236, ගාලු පාර, කොළඹ 03.

*........................පැමිණිලිකරු,*

*එදිරිව*

මෙතිස්ගේ ප්ලැසිඩස් ලයනල් දබරේරා,
අංක 245/34, කොන්දගම්මුල්ල,
දෙමන්හන්දිය.

*...........................විත්තිකරු.*

ඉහත නම් සඳහන් විත්තිකරු වෙත ය.

වර්ෂ 2019 ක් වූ දෙසැම්බර් මස 17 වැනි දින ඇතුලත් කර ඇති තීන්දු ප්‍රකාශය ප්‍රකාරව ඉහත නම් කර ඇති විත්තිකරු විසින් පැමිණිලිකරුට,

(අ) රුපියල් හතළිස් අටලක්ෂ හතළිස් හතර දහස් අටසිය හතළිස් දෙකයි ශත අසූඅට (4,844,842.88) ක මුදලක් සහ එම මුදල සම්පූර්ණයෙන් ගෙවා අවසන් වන තෙක් 2015.03.27 වන දින සිට ප්‍රධාන ණය මුදල මත වසරකට 26% ක් බැගින් වූ පොළියක් ද, හිඟ තබන ලද වාරික මත 5% ක අඩ පොළිය සහ වෙනත් වියදම් ද ගෙවීමටත්, සහ

(ආ) නඩු ගාස්තු ලබා දෙන ලෙසටත් විත්තිකරු එකඟ වී ඇති හෙයින් ද,

එසේ වුවත් පැමිණිලිකාර ආයතනය විසින් පොළි අයකර ගැනීමේ දී නීති සිවිල් ආඥා පනතේ 5 වන වගන්තියට යටත්වන බැවින් ගෙවීමට හිඟව ඇති මුදලට ගණනය කරන පොළිය එකී හිඟ මුදල ඉක්මවා නොයන මුදලක් විය යුතු බවට නියෝග කොට තීන්දු ප්‍රකාශ කර ඇති බැවින් ද,

ඒ අනුව විත්තිකරු විසින් තීන්දු ප්‍රකාශනයෙන් පසුව කිසිදු මුදලක් ගෙවා නොමැති බවත්, මුදල් ගෙවීමට අපොහොසත් වී සහ පැහැර හැර ඇති බවත්, ඒ අනුව විත්තිකරුට අයත් චංචල සහ නිශ්චල දේපල, වත්කම් බැරකම් සහ ලැබීම් තහනම් කර අවශ්‍ය වුවහොත් ඒවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා මුදල් අයකර දීමට බලය පැවරී ඇති හෙයින් ද, මෙහි පහත උපලේඛනයේ විස්තර කරනු ලබන දේපල, **වර්ෂ 2023 ක් වූ අප්‍රේල් මස 04 වැනි දින ප.ව. 2.30 ට** එකී දේපල පිහිටා ඇති දෙමංහන්දිය, කොන්දගම්මුල්ල, පල්ලිය පාර, අංක 245/20 දරන දේපල මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් ප්‍රසිද්ධ කොට ප්‍රකාශ කරනු ලැබේ.

ගෙවීමේ ක්‍රමය.- වෙන්දේසියේ දී ඉහළම ලංසු තබන්නා ගැණුම්කරු වන අතර, වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින්,

i. මුල් ගැණුම් මිලෙන් 25% ක මුදලක් ද,
ii. තක්සේරු ගාස්තුව වන 0.5% ක් ද,
iii. වෙන්දේසි ගාස්තු සහ රජයේ ගාස්තු ද,

විකිණීම අවසන් වූ වහාම ගැණුම්කරු විසින් අදාළ මුදලින් මා වෙත (වෙන්දේසිකරු) ගෙවිය යුතුය. චෙක්පත් භාරගනු නොලැබේ. ගැණුම් මිලෙන් ගෙවන ලද්දේ 25% ක මුදලක් පමණක් නම් ගැණුම් මිලෙන් ඉතිරි මුදල වන 75% ක මුදල දින 30 ක් ඇතුළත කොළඹ දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවට තැන්පත් කළ යුතුය.

## උපලේඛනය

01. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරලේ, දූනගහපත්තුවේ, මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ සීමාව තුළ කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ කටාන ප්‍රාදේශීය සභා බල සීමාව තුළ අංක 93 කොන්දගම්මුල්ල ග්‍රාම නිලධාරී කොට්ඨාසයට අයත් කොන්දගම්මුල්ල යන ගම පිහිටි තෙක්කවත්ත, උළුවත්තේ ආගාරේ සහ ගල්ලිදගාව ඕවිට නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජී. ජී. වී. හස්තනායක මහතා විසින් මැන සාදන ලද අංක 1891 සහ 1997.12.10 දිනැති පිඹුරේ කැබලි අංක 1 දරන ඉඩමට මායිම් උතුරු - නැගෙනහිරට: ලොට් 8 ද, නැගෙනහිර: දකුණට: - ලොට් 2 ද, නැගෙනහිර - බටහිරට : පාර ද, උතුරු - බස්නාහිරට: මෙම ඉඩමේ කොටසක් ද යන මායිම් වන පර්චස් දහ අටයි දශම දෙකයි පහක් (පර්. 18.25) ක් විශාල ඉඩම් කොටස ද හා ඒ තුළ පිහිටි ගහකොළ, පළතුරු ගොඩනැගිලි ආදී සෑම සියලු දේත් සමග වේ. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දූනට H541/34දරන පත්ඉරුවේ ලියාපදිංචි වී ඇත.

02. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරලේ, දූනගහපත්තුවේ, මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයට අයත් කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ කටාන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 93 කොන්දගම්මුල්ල ග්‍රාම නිලධාරී කොට්ඨාසයට අයත් කොන්දගම්මුල්ල ගම පිහිටි තේක්කවත්ත, උළුවත්තේ ආගාරේ සහ ගල්ලිදගාව ඕවිට නමැති ඉඩමට 1997.12.10 දින ජී. ජී. වී. හස්තනායක බලයලත් මානක තැන මැන සාදන ලද අංක 1891 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් 2 දරන ඉඩම් කොටසට මායිම් - උතුරු නැගෙනහිරට: ලොට් 7 ද, නැගෙනහිර - දකුණට: ලොට් 13 ද, නැගෙනහිර - බටහිරට: පාරද, උතුරු - බස්නාහිරට: ලොට් 1 ද යන මායිම් තුළ පිහිටි පර්චස් දාහතයි දශම හතයි පහක් (පර්. 17.75) ක් විශාල ඉඩම් කොටස හා ඒ තුළ පිහිටි ගසකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සෑම සියලු දේත් සමඟ වේ. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දූනට H 541/35 දරන පත් ඉරුවේ ලියාපදිංචි වී ඇත.

*මාර්ග අයිතිය*.- ඉහත කී අංක 1891 දරන පිඹුරේ නිරූපිත ලොට් 13 දරන මීටර් 06 කින් පළල පාරකට වෙන් කළ බීම් තීරය පොදුවේ පරිහරණය කිරීමේ මාර්ග පරවශ්‍යතා අයිතිවාසිකම සමඟ වේ.

*දේපලට පිවිසීම*.-මීගමුව සිට දිවුලපිටිය පාරේ Y හන්දියෙන් දකුණට හැරී ඉදිරියට ගමන් කරන විට දකුණට කොන්දගම්මුල්ල පල්ලිය පාර හමුවේ. එහි මීටර් 50 ක් ඉදිරියට යන විට වම්පස පිහිටි අංක. 245/20 දරන පොල් සහිත පර්චස් 36 ක ඉඩම හමුවේ.

එම්. එම්. කේ. ශ්‍රියාන්ත,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණ - මීගමුව.

වර්ෂ 2023 ක් වූ ජනවාරි මස 18 වැනි දින.

02-13/2

# විවිධ දැන්වීම්

**සිවිල්/වාණිජ අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් (කොළඹ දී පවත්වනු ලබන) බස්නාහිර පළාතේ මහාධිකරණයේ දී ය**

ගණන් බේරා වසා දැමීම පිළිබඳ දැන්වීම

1939 සමාගම් ගණන් බේරා වසා දැමීමේ රීති සමග කියවිය යුතු 2007 අංක 7 දරන සමාගම් පනතේ 272 වන වගන්තිය යටතේ සහ එය ප්‍රකාරව ගණන් බේරා වසා දැමීමේ ඉල්ලීමක් පිළිබඳ කාරණයේ දී ය.

නඩු අංකය : CHC 68/2022/CO
ස්වභාවය : ගණන් බේරා වසා දැමීම
වටිනාකම : රු. 7,138,032.36

ජී. ටී. බී. ස්ටීල් කෝපරේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අංක : 15, බොතේජු පටුමග,
තිඹිරිගස්යාය පාර,
කොළඹ 05,
ශ්‍රී ලංකාව.

........................*පෙත්සම්කරු.*

*එරෙහිව*

ණිමොවි සිවිල් ඉංජිනියර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
Nimovi Civil Engineers (Private) Limited
අංක 01- පලවෙනි පටුමග,
පරන නාවල පාර,
ශ්‍රී ඥානේන්ද්‍ර මාවත,
නාවල.

.........................*වගඋත්තරකරු.*

කොළඹ දී පැවැත්වෙන හා සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරන බස්නාහිර පළාත් මහාධිකරණය මගින් ඉහත නම සඳහන් නිමෝවි සිවිල් ඉංජිනියර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම ගණන් බේරා වසා දැමීම සඳහා වන පෙත්සමක් ඉහත නම් සඳහන් පෙත්සම්කරු විසින් 2022 දෙසැම්බර් මස 15 වැනි දා එකී අධිකරණය වෙත ඉදිරිපත් කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ. එකී පෙත්සම 2023 මාර්තු මස 31 වැනි දා විමසීමට ගැනීමට නියම කොට ඇති අතර, එකී සමාගමේ කිසියම් ණය හිමියකු හෝ සේවාදායකයකු හෝ එකී පෙත්සම පිළිබඳ නියෝගයක් නිකුත් කිරීමෙහි ලා පක්ෂ වීමට හෝ විරුද්ධ වීමට බලාපොරොත්තු වේ නම්, නඩුව, විභාග වන අවස්ථාවේ දී සිය ලේඛණගත නිතීඥවරයකු මගින් හෝ පුද්ගලිකව පෙනී සිටිය හැකි අතර, පෙත්සමේ පිටපතක් අවශ්‍යවන ඕනෑම ණය හිමියෙකුට හෝ සේවාදායකයකුට, ඒ සඳහා නිර්දේශිත ගාස්තුව ගෙවූ විට පහත අත්සන් කරන අය විසින් ලබා දෙනු ඇත.

මල්ලවාරච්චි ඇසෝසියේට්ස්,
පෙත්සම්කරුවන් ලේඛනගත නීතිඥවරුන්,
අංක 29/1 බෙල්මන්ට් වීදිය, කොළඹ 12.

***සටහන*** - මෙම නඩුව විමසීමට ගන්නා අවස්ථාවට පැමිණ සිටීමට බලාපොරොත්තු වන යම් අයෙක් වේ නම්, එසේ කිරීමට කැමැත්ත දක්වමින් තම අත් අකුරින්ම ලියූ නිවේදනයක් පෙත්සම්කරුවන් ඉහත නම් සඳහන් ලේඛණගත නීතිඥවරයා වෙත තැපැල් මගින් එවීම හෝ ගෙනැවිත් භාර දීම කළ යුතුය. එම නිවේදනයේ පුද්ගලයාගේ නම හා ලිපිනය සමාගමක් නම් සමාගමේ නම හා ලිපිනය සඳහන් කොට පුද්ගලයා හෝ සමාගම හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ නීතිඥයා (සිටීනම්) විසින් අත්සන් කොට ගෙනැවිත් භාර දීම හෝ තැපැල් මගින් එවන්නේ නම් ඉහත නම සඳහන් අය වෙත කල්වේලා ඇතිව 2023 මාර්තු මස 30 වැනි දින සවස හයේ (ප.ව. 6.00) කණිසමට පෙර තැපැල් කිරීම හෝ කළ යුතුය.

මල්ලවාරච්චි, ඇසෝසියේට්ස්,
පෙත්සම්කරුගේ ලේඛණගත නීතිඥවරුන්.

02-110/1

**සිවිල්/වාණිජ අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් (කොළඹදී පවත්වනු ලබන) බස්නාහිර පළාතේ මහාධිකරණයේ දී ය**

ගණන් බේරා වසා දැමීම පිළිබඳ දැන්වීම

1939 සමාගම් ගණන් බේරා වසා දැමීමේ රීති සමග කියවිය යුතු 2007 අංක 7 දරන සමාගම් පනතේ 272 වන වගන්තිය යටතේ සහ එය ප්‍රකාරව ගණන් බේරා වසා දැමීමේ ඉල්ලීමක් පිළිබඳ කාරණයේ දී ය.

නඩු අංකය : CHC 69/2022/CO
ස්වභාවය : ගණන් බේරා වසා දැමීම
වටිනාකම : රු. 11,863,852.29

ජේ. ටී. බී. ස්ටීල් කෝපරේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අංක : 15, බොතේජු පටුමග,
තිඹිරිගස්යාය පාර,
කොළඹ 05,
ශ්‍රී ලංකාව.

.............................පෙත්සම්කරු.

.

*එරෙහිව*

සැම්ලැන්ක් ඩිවලොපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
Zamlank Developers (Private) Limited
අංක 01- පලවෙනි පටුමග,
පරන නාවල පාර,
ශ්‍රී ඥානේන්ද්‍ර මාවත,
නාවල.

............................වගඋත්තරකරු.

කොළඹ දී පැවැත්වෙන හා සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරන බස්නාහිර පළාතේ මහාධිකරණය මගින් ඉහත නම සඳහන් සැම්ලැන්ක් ඩිවලොපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම ගණන් බේරා වසා දැමීම සඳහා වන පෙත්සමක් ඉහත නම් සඳහන් පෙත්සම්කරු විසින් 2022 දෙසැම්බර් මස 15 වැනි දා එකී අධිකරණය වෙත ඉදිරිපත් කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ. එකී පෙත්සම 2023 මාර්තු මස 31 වැනි දා විමසීමට ගැනීමට නියම කොට ඇති අතර, එකී සමාගමේ කිසියම් ණය හිමියකු හෝ සේවාදායකයකු හෝ එකී පෙත්සම පිළිබඳ නියෝගයක් නිකුත් කිරීමෙහි ලා පක්ෂ වීමට හෝ විරුද්ධ වීමට බලාපොරොත්තු වේ නම්, නඩුව,විභාග වන අවස්ථාවේ දී සිය ලේඛණගත නිතීඥවරයකු මගින් හෝ පුද්ගලිකව පෙනී සිටිය හැකි අතර, පෙත්සමේ පිටපතක් අවශ්‍යවන ඕනෑම ණය හිමියෙකුට හෝ සේවා දායකයකුට, ඒ සඳහා නිර්දේශිත ගාස්තුව ගෙවූ විට පහත අත්සන් කරන අය විසින් ලබා දෙනු ඇත.

මල්ලවාරච්චි ඇසෝසියේට්ස්,
පෙත්සම්කරුගේ ලේඛනගත නීතිඥවරුන්,
අංක 29/1 බෙල්මන්ට් වීදිය, කොළඹ 12.

*සටහන* - මෙම නඩුව විමසීමට ගන්නා අවස්ථාවට පැමිණ සිටීමට බලාපොරොත්තු වන යම් අයෙක් වේ නම්, එසේ කිරීමට කැමැත්ත දක්වමින් තම අත් අකුරින්ම ලියූ නිවේදනයක් පෙත්සම්කරුගේ ඉහත නම් සඳහන් ලේඛණගත නීතිඥවරයා වෙත තැපැල් මගින් එවීම හෝ ගෙනැවිත් භාර දීම කළ යුතුය. එම නිවේදනයේ පුද්ගලයාගේ නම හා ලිපිනය සමාගමක් වේ නම් සමාග මේ නම හා ලිපිනය සඳහන් කොට පුද්ගලයා හෝ සමාගම හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ නීතිඥයා (සිටීනම්) විසින් අත්සන් කොට ගෙනැවිත් භාර දීම හෝ තැපැල් මගින් එවන්නේ නම් ඉහත නම සඳහන් අය වෙත කල්වේලා ඇතිව 2023 මාර්තු මස 30 වැනි දින සවස හයේ (ප.ව. 6.00) කණිසමට පෙර තැපැල් කිරීම හෝ කළ යුතුය.

මල්ලවාරච්චි, ඇසෝසියේට්ස්,
පෙත්සම්කරුගේ ලේඛණගත නීතිඥවරුන්.

02-110/2

**සිවිල්/වාණිජ අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් (කොළඹදී පවත්වනු ලබන) බස්නාහිර පළාතේ මහාධිකරණයේ දී ය**

ගණන් බේරා වසා දැමීම පිළිබඳ දැන්වීම

1939 සමාගම් ගණන් බේරා වසා දැමීමේ රීති සමග කියවිය යුතු 2007 අංක 7 දරන සමාගම් පනතේ 272 වන වගන්තිය යටතේ සහ එය ප්‍රකාරව ගණන් බේරා වසා දැමීමේ ඉල්ලීමක් පිළිබඳ කාරණයේ දී ය.

ජී. ටී. බී. ස්ටීල් කෝපරේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අංක : 15, බොතේජු පටුමග,
තිඹිරිගස්යාය පාර,
කොළඹ 05,
ශ්‍රී ලංකාව

..........................*පෙත්සම්කරු.*

නඩු අංකය : CHC 67/2022/CO
ස්වභාවය : ගණන් බේරා වසා දැමීම
වටිනාකම : රු. 41,816,030

*එරෙහිව*

කීඩ්වෙල් (ප්‍රයිවට්) ලිමිටඩ්,
Keydwell (Private) Limited
අංක 01- පලවෙනි පටුමග,
ඥානේන්ද්‍ර මාවත,
නාවල.

....................... *වගඋත්තරකරු.*

කොළඹ දී පැවැත්වෙන හා සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරන බස්නාහිර පළාත් මහාධිකරණය මගින් ඉහත නම සඳහන් කීඩ්වෙල් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම ගණන් බේරා වසා දැමීම සඳහා වන පෙත්සමක් ඉහත නම් සඳහන් පෙත්සම්කරු විසින් 2022 දෙසැම්බර් මස 15 වැනි දා එකී අධිකරණය වෙත ඉදිරිපත් කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ. එකී පෙත්සම 2023 මාර්තු මස 31 වැනි දා විමසීමට ගැනීමට නියම කොට ඇති අතර, එකී සමාගමේ කිසියම් ණය හිමියකු හෝ සේවාදායකයකු හෝ එකී පෙත්සම පිළිබඳ නියෝගයක් නිකුත් කිරීමෙහි ලා පක්ෂ වීමට හෝ විරුද්ධ වීමට බලාපොරොත්තු වේ නම්, නඩුව,විභාග වන අවස්ථාවේ දී සිය ලේඛණගත නිතීඥවරයකු මගින් හෝ පුද්ගලිකව පෙනී සිටිය හැකි අතර, පෙත්සමේ පිටපතක් අවශ්‍යවන ඕනෑම ණය හිමියෙකුට හෝ සේවා දායකයකුට, ඒ සඳහා නිර්දේශිත ගාස්තුව ගෙවූ විට පහත අත්සන් කරන අය විසින් ලබා දෙනු ඇත.

මල්ලවාරච්චි ඇසෝසියේට්ස්,
පෙත්සම්කරුගේ ලේඛනගත නීතිඥවරුන්,
අංක 29/1 බෙල්මන්ට් වීදිය, කොළඹ 12.

*සටහන* - මෙම නඩුව විමසීමට ගන්නා අවස්ථාවට පැමිණ සිටීමට බලාපොරොත්තු වන යම් අයෙක් වේ නම්, එසේ කිරීමට කැමැත්ත දක්වමින් තම අත් අකුරින්ම ලියූ නිවේදනයක් පෙත්සම්කරුගේ ඉහත නම් සඳහන් ලේඛණගත නීතිඥවරයා වෙත තැපැල් මගින් එවීම හෝ ගෙනැවිත් භාර දීම කළ යුතුය. එම නිවේදනයේ පුද්ගලයාගේ නම හා ලිපිනය සමාගමක් වේ නම් සමාගමේ නම හා ලිපිනය සඳහන් කොට පුද්ගලයා හෝ සමාගම හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ නීතිඥයා (සිටීනම්) විසින් අත්සන් කොට ගෙනැවිත් භාර දීම හෝ තැපැල් මගින් එවන්නේ නම් ඉහත නම සඳහන් අය වෙත කල්වේලා ඇතිව 2023 මාර්තු මස 30 වැනි දින සවස හයේ (ප.ව. 6.00) කණිසමට පෙර තැපැල් කිරීම හෝ කළ යුතුය.

මල්ලවාරච්චි, ඇසෝසියේට්ස්,
පෙත්සම්කරුගේ ලේඛණගත නීතිඥවරුන්.

02-110/3